# ග්‍රාම සංවර්ධන සැලැස්ම

# Village Development Plan

# 2025 - 2029

**කැස්බෑව - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**ග්‍රාම නිලධාරි වසම - හල්පිට**

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම සහ අංකය<br>**Name of GN Division and Number** | - | හල්පිට 570 |
| වසමේ ස්වභාවය (ග්‍රාමීය, වතු, නාගරික)<br>**Nature of the GN Division (Rural, Estate,Urban)** | - | අර්ධ නාගරික |
| වසමෙහි ඇතුළත් ගම්මාන සංඛ්‍යාව සහ ඒවායේ නම්<br>**Number of Villages and their Names** | - | දූවත්ත ගලබඩ වත්ත<br>දවටගහවත්ත හයිවෙ ටෙරස්<br>සෞම්‍ය උයන ගොඩපර<br>ගහවත්ත<br>හල්පිට වත්ත |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය<br>**Divisional Secretariet** | - | කැස්බෑව |
| දිස්ත්‍රික්කය<br>**District** | - | කොළඹ |

......................................

සකස්කලේ

......................................

නිර්දේශය

...........................................

අනුමැතිය

## 1. ක්‍රමවේදය - Methodology

(ග්‍රාමීය ප්‍රජාවද ඇතුළත්ව වසමේ සියලු පාර්ශවයන්ගේ අදහස් නියෝජනය වන ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය/ A methodology which represents idias and suggestions of all stakehoders including village community)

වසම තුළ සේවා සපයන රාජ්‍ය නිළදාරීන් ප්‍රජා සංවිධාන නිළදාරීන් දේශපාළන අධිකාරිය සහ ප්‍රමුකතම පාර්ශවය වන ප්‍රජාවගේ අදහස් හා යෝජනා මගින් අවශ්‍යතා හදුනාගෙන ඒ අනුව සකසන ලදී

### 1.1 අරමුණු - Objectives

සංවර්ධනය යනු හුදෙක්ම එක් අංශයක් පමණක්ම වර්ධනය වීමක් නොවේ. එය වූ කල් සමාජ ආර්ථික සංස්කෘතික ආදී වූ තුනී සේවාවක සංකලනයකින් යුතු වර්ධනයකි. රටක ආයතනයක හෝ සංවිධානයක අරමුණු හා පරමාර්ථ ගොඩනැගීම සඳහා අනාගතය වෙනුවෙන් වර්තමානයේ සකස් කරන වැඩ පිළිවෙළ සංවර්ධන සැලැස්මක් ලෙස හඳුනාගත හැක ඒ අනුව ගමේ සියලු ප්‍රජාව ඉලක්ක කර ගත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ඉතා කාලෝචිත පියවරකි. විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධනයේදී වැඩි අවධානයක් ආර්ථික හා සමාජීය වශයෙන් පසුබෑමට ලක් වූ ප්‍රජාව කෙරෙහි යොමුවීම අත්‍යවශ්‍ය කරුනකි . ග්‍රාමීය ප්‍රජාව සතු අවශ්‍යතා හා ගැටලු හඳුනා ගැනීමත් සියලු ප්‍රජා සංවිධාන ඒකාබද්ධ කරමින් රජයේ සංවර්ධන ක්‍රියාදාමයට දායක විය හැකි සමෘද්ධිමත් ජන සමාජයක් බිහි කිරීම සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණයි. ග්‍රාමීය සංවර්ධනය තුළ ප්‍රජා සහභාගීත්වය අනිවාර්ය අංගයකි. ඒ අනුව සංවර්ධනය යනු “ ප්‍රජාව තුළින් ඉපදී ප්‍රජාව තුළින් වර්ධනය වී ප්‍රජාව තුළින් පෝෂනය විය යුතු සංකල්පයකි. එම අරමුණු කරා ලගා වීමට සැලසුම් කිරීම මෙහි අරමුණයි.


### 1.2 සහභාගිත්ව පාර්ශවයන් - Stakeholders involved

1. වසමේ සේවය කරන රාජ්‍ය නිළදාරීන්
2. ප්‍රජා සංවිධාන වල නියෝජිතයින්
3. ග්‍රාමීය ප්‍රජාව
4. ප්‍රජා නායකයින් හා දේශපාලන අධිකාරිය
5. වසමෙ සම්පත් පැතිකඩ

## 2. වසමේ පිහිටීම හා භූමි ප්‍රමාණය - Land Extend and the Location of GN Division

**හෙක්ටෙයාර 120ක භූමියකට හිමිකම් කියන 570 හල්පිට වසම 1.24 m 2 වපසරයකින් යුක්තය .හෝමාගම පාදේශීය ලේඛම් කොට්ඨාසයට මායිම් වන කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙලවරක පිහිටි වසමකි . උතුරින් 120 හොරණ කොළඹ මාර්ගයත් දකුණින් නිවුන්ගම මොරද්ද වසමද නැගෙනහිරින් පොල්ගස්ඕවිට වෙළකුඹුර මාර්ගයත් බටහිරින් මාකන්දන නැගෙනහිර වසමද මෙම භූමි භාගයෙහි මායිම් වේ.මේ තුළ අක්කර 120 ක කුඹුරු ඉඩම් ප්‍රමාණයක් දක්නට ලැබේ. සුවිශේෂී පිහිටීමකි.**

**3.වසමේ සිතියම - GN Division Map**



**4.** වසමේ හරස්කඩ චාරිකාව **- Cross Section of the GN Division**

හල්පිට ගම ඉතා රමණීය වෙල්යායවල් කිහිපයකින් වටවී පවතී.හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් වන සුන්දර ගම් පියස්සකි.ඇළ මාර්ග 3ක් ගම මැදින් ගලාගෙන යයි. අක්කර 120ක කුඹුරු බිම් තිබුනද ඉන් අක්කර 35ක් පුරන් වී තිබේ.පුරන් කුඹුරු ආශ්‍රිතව ආක්‍රමික වෙල් ආක්‍රමික වැවී ඇති අතර ඒවා ඉවත් කර කුඹුරු නැවත වගා කිරීම ගොවියන් මුහුණදෙන ප්‍රමුඛතම ගැටළුවකි.

ප්‍රදේශයේ බැලූ බැලූ තැන කුඹුරු ඉඩම් හා කුඹුරු මධ්‍යයේ ඇති කමත් ඉඩම් හා කොටු වල එළවලු වගා ඇත. අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කරන ලද විශාල පිරිසක් අතීතයේ සිටි අතර ඒ සඳහා පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයක් තිබී ඇත.අද වන විට ඒ මත පොල් ගහක් කඩා වැටී එම ගොඩනැල්ල යන්ත්‍ර සූත්‍ර දිරාපත් වෙමින් පවතී.

ගමේ සැළකිය යුතු පිරිසක් කෘෂි කර්මාන්තයේ නිරත වන අතර ඉදිරි පරම්පරාව කෘෂි කර්මාන්තයේ නිරත වීමක් දක්නට නොලැබෙන තරමින් Print line ලෙස රෙදි පිළි ආයතනයක් ඇති අතර ඒ තුළ ගමේ සැළකිය යුතු පිරිසක් රැකියා කරන අතර රැකියාද ඒ තුළින් නිර්මානය වී ඇත.තවත් පිරිසක් ගමෙන් බැහැරව රැකියා සඳහා ගමන් කරයි.

ගෘහාශ්‍රිත සත්ත්ව පාලනය ගෙවතු වගාව හා අනෙකුත් කෘෂි කාර්මික කටයුතු වලින් සැළකිය යුතු පිරිසක් ජීවත් වෙයි.

ජනශක්ති පුර විහාර අසළින් ගමන් අරබා හර්මන් මයිනාර් මාවතින් ගමන් කරන්නෙකුට SOS ළමා ගම්මානය හා හර්මන් මයිනර් විද්‍යාලය හමුවේ.දෙමාපිය රැකවරනය අහිමි හෝ වෙනත් විශේෂිත හේතු මත නේවාසික රැකවරණය ලබන දරුවන් විශාල ප්‍රමාණයක් එම ගම්මානයේ ඇත.

මෙම ගම්මානය හරහා බස් රථයක් ගමන් නොකිරීම නිසා ප්‍රවාහන පහසුකම් සපයාගැනීම සඳහා වැඩි පිරිසකට පයින් යාමට සිදුවී තිබේ.

මෑත අතීතයේ හල්පිට ප්‍රාථමික විදුහල නමින් පාසලක් සමිතිය හරහා ආරම්භ කර ඇති අතර පසුව අධ්‍යාපන වෙත පවරා තිබේ. එය පසුකාලීනව වැසී ගිය අතර එම ගොඩනැගිලි හා භූමිය ග්‍රාම සංවර්ධනය මගින් පාලනය වෙයි. එම ගොඩනැගිල්ලේ රජයේ පෙර පාසලක් පසු ගිය වසර තෙක් කැස්බෑව නගර සබාව හරහා පවත්වාගෙන ගිය අතර ගොඩනැගිල්ලේ වහලය දිරාපත් වීම මත ඇතිවූ අනාරක්ෂිත තත්වය නිසා දවටගහවත්ත ප්‍රජා ශාලාව වෙත එය රැගෙන ගොස් ඇත.

ක්‍රීඩා පිටි දෙකක් හා අත්පන්දු පිටියක් ඇති අතර වල් බිහිවීම මත නිසි නඩත්තු කිරීමක් නොමැතිවීම හරහා දරුවන් ක්‍රීඩාවෙන් ඉවත්ව ඇත.

විශාල ඉඩම් කට්ටි හිමි පාරම්පරික මුල් හිමිකරුවන් පිරිසක්ද හදුනාගත හැකි අතර දැන් දැන් ඉඩම් කට්ටි වෙන්දේසි වීම මත අලුත් පදිංචිකරුවන්ද විශාල පිරිසක් දක්නට ලැබේ. ප්‍රදේශයේ ඇතැම් ස්ථානවල වුවත් පරිහරණ ඉඩම්ද හදුනාගත හැකිය. ඇතැම් ස්ථාන අධිකව මෙතෙක් කිසිදු සංවර්ධනයක් කර නොමැති මාර්ග කිහිපයක්ද හදුනාගත හැකිය.

(වසමේ ස්වාභාවික සහ භෞතික සම්පත්, ජනාවාසකරණය, ඉඩම් පරිහරණය, යටිතල පහසුකම් සහ ගැටළු ආදිය හදුනාගත යුතුය/ Natural and physical resources, habitation, land use pattern, infrastructure and issues ect.should be identified)

**5.** වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම **- Historical and Cultural Background of GN Division**

කොළඹ දිස්ත්‍රික්කයට අයත් සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවට කෙළවරට වීමට හල්පිට ගම පිහිටා ඇත.ඈත අතීතයේ විශාල වශයෙන් හල්ගස් වැඩී තිබීම නිසා හල්පිට යනුවෙන් හැදින් වූ බව විශ්වාස කෙරේ.ජනතාව අතර පවතින තවත් මතයක් වන්නේ සල්ගස් විශාල පමාණයක් පැවතීම නිසා පසුකාලීනව

සල්පිට හල්පිට වූ බවයි. ප්‍රදේශයේ විශාල වශයෙන් වී වගාව පැතිර පෙනෙයි.වී විශාල ලෙස අව්වේ දමා වියලා ඇති අතර ඒවා සහල් පිට්ටනි ලෙස හදුන්වා ඇත. සහල් පිටි හල්පිට වූ බව තවත් මතයකි.

වර්ෂ 1935 වන විට මෙම ගම කැස්බෑවට අයත් ගම් කාර්ය සභාවෙන් පාලනය වූ අතර දැනට මහේස්ත්‍රාත් අධිකරණය පිහිටා ඇත්තේ එම භූමිභාගය තුළයි.හෙක්ටයාර 120 ක භූමිභාගයක් පිහිටා ඇති මෙම ගම වටා පැවතියේ සුන්දර වෙල් යායකි.මෙම ගම්මානයේ ජනගහනය 250ක් තරම් ඉතා කුඩා සංඛ්‍යාවක් ජීවත්ව තිබේ.හල්පිට ගම්මානයේ ඉතිහාසය කෝට්ටෙ යුගය දක්වා දිව යන බව ගම්වැසියන්ගේ අදහසයි.ගමට මායිම්ව ඇති රමණීය කෙත් යාය උඩින් සැළලිහිණි සංදේශයේ සැළලිහිණියා සංදේශය රැගෙන ගමන් කළ බවට ගම්වාසීන් අතර මතයක් පවතී.වර්ෂ 1936 දි පැවති ගම් සභාවේ ගම් කාර්ය සභිකයෙකු ලෙස කටයුතු කළ පබිලින් වෙද මහතා ගම සංවර්ධනය කිරමේ නියමුවෙකු ලෙස කටයුතු කර ඇත.

ආගමික කටයුතු සහ පැරන්නන් විසින් පොල්ගස්ඕවිට ශ්‍රී පඤ්ඤාවංශ විහාරස්ථානය යොදා ගෙන ඇත.නමුත් වර්තමානයේ සල්පිට ජනශක්තිපුර විහාරය හා විමලාරාම විහාරස්ථාන දෙකක් බෞද්ධ ආගමික කටයුතු සදහා යොදාගනියි.ජනශක්තිපුර විහාරස්ථානයට යාබදව ඇති ඉඩම් කට්ටි 37ක් 1970 දශකය තුළ කැස්බෑව සංස්කෘතික ඇමතිව සිටි සෝමවීර චන් සිරි මැතිතුමා විසින් ගොඩනගා ඇත.හල්පිට ගමේ ගම්මුලැදෑනියා ලෙස සේවය කර ඇත්තේ කන්නන්ගර රාළහිමිය.පී.ඩී විජේවර්දන නමින් මුලැදෑනියෙකු කටයුතු කර ඇත.

## 6. වසමේ සාමාන්‍යය කාලගුණික සහ දේශගුණික තත්ත්වය - Weather and Limatic Condition

| සංරචකය - Indicator | ජන: Jan | පෙබ: Feb | මාර්තු Mar | අප්‍රේල් Apr | මැයි May | ජූනි June | ජූලි July | අගෝ Aug | සැප්: Sep | ඔක්: Oct | නොවැ Nov | දෙසැ: Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂාව- Rainfall (mm) | ✓ | ✓ | | | ✓ | ✓ | | | | ✓ | ✓ | |
| උෂ්ණත්වය- Temperature (Centigrade) | | | ✓ | ✓ | | | ✓ | ✓ | ✓ | | | ✓ |

## 7. වසමේ සම්පත් සිතියම - Resource Map



**8. භූමි පරිභෝජනය - Land Use**

| අනු අංකය S.No | භූමි පරිභෝජනය - Land Use | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) (ha) |
|---|---|---|
| 1 | ප්‍රධාන වැවිලි – Main Crop | 5 |
| 2 | සුළු අපනයන බෝග – Minor Export Crops | 5 |
| 3 | වී වගාව - Paddy Cultivation<br>වගා කරන - Cultivating Land<br>පුරන් කුඹුරු - Abandoned Land | 37.77<br>37.77<br>15.55 |
| 4 | වෙනත් කාලීන බෝග වගාව (1,2 සඳහා අයත් නොවන) - Seasonal Crops Exept 1 & 2 | 2 |
| 5 | ගෙවතු වගාව - Home Gardens | 5 |
| 6 | මිශ්‍ර භෝග - Mix Crops | 1.5 |
| 7 | ජලයෙන් යටවූ බිම් (වැව්, ජලාශ, වාරි මාර්ග, ගංගා) – Water Land (Lake, Resevoirs, Irrigation , Rivers) | 1.2 |
| 8 | රජයේ ඉඩම් - Crown Land<br>දැනට භාවිත කරන - Used<br>දැනට භාවිත නොකරන - Unused<br>නොකරන නමුත් වගා කිරීමට සුදුසු - Unused but Cultivatable Lands | 0.1<br>0.1<br>- |
| 9 | ගල්/ වගුරු සහිත හා මුඩු බිම් - Bare Land | - |
| 10 | මාර්ග - Road (Km) | 18 |
| 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් - Buildings and Constructions | 21 |
| 12 | ස්වභාවික කැලෑ - Natural Forest | - |
| 13 | වෙනත්- Others | 7.88 |
| **එකතුව - Total** | | **120** |

**9. වසමේ සමාජ පසුබිම් විශ්ලේෂණය - Social Background of the GN Division**

| වසමේ මුළු ජනගහනය - Total Population in GN Division | වසමේ මුළු පවුල් ගණන - Total Families in GN Division | වසමේ ලියාපදිංචි මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව - Total Registerd Voters in GN Division | වසමේ පදිංචි මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව - Total Voters Live in GN Division | වසමේ මුළු නිවාස ගණන - Total Houses in GN Division | වසමේ මුළු භූමි ප්‍රමාණය (ව.කිමී.) - Total Land Area in GN Division (Sq.km) |
|---|---|---|---|---|---|
| 6444 | 1662 | 4712 | 4921 | 1526 | 1.2 |

### 9.1 ජාතීන් අනුව ජන සංයුතිය - Ethnicity

| | සිංහල - Sinhala | ද්‍රවිඩ - Tamil | මුස්ලිම් - Muslims | වෙනත්- Other | මුළු එකතුව - Grand Total |
|---|---|---|---|---|---|
| ස්ත්‍රී - Female | 3388 | 10 | 11 | 18 | 3427 |
| පුරුෂ- Male | 2990 | 6 | 8 | 13 | 3017 |
| එකතුව- Total | 6378 | 19 | 19 | 31 | 6444 |

### 9.2 ආගම අනුව ජන සංයුතිය - Religious

| | ජනගහනය - Population |
|---|---|
| බුද්ධාගමික - Buddhist | 6242 |
| හින්දු - Hindu | 16 |
| ඉස්ලාම් - Islam | 19 |
| කතෝලික - Catholic | 136 |
| වෙනත් - Others | 31 |

### 9.3 වයස් කාණ්ඩ - Age Groups

| අනු අංකය No | වයස් කාණ්ඩය - Age Catogery | ස්ත්‍රී පුරුෂභාවය - Gender | | එකතුව - Total |
|---|---|---|---|---|
| | | ස්ත්‍රී - Female | පුරුෂ - Male | |
| 1 | අවුරුදු 0 -5 / Age 0 -5 | **160** | **119** | **279** |
| 2 | අවුරුදු 6 -10 /Age 6 -10 | **158** | **143** | **301** |
| 3 | අවුරුදු 11-17 /Age 11-17 | **332** | **308** | **640** |
| 4 | අවුරුදු 18-29 / Age 18-29 | **522** | **504** | **1026** |
| 5 | අවුරුදු 30-45/ Age 30-45 | **1172** | **1056** | **2228** |
| 6 | අවුරුදු 46-59 /Age 46-59 | **755** | **702** | **1457** |
| 7 | අවුරුදු 60-69 / Age 60-69 | **197** | **98** | **295** |
| 8 | අවුරුදු 70-99/ Age 70-99 | **131** | **87** | **218** |
| 9 | අවුරුදු 100 හා වැඩි / Age Over 100 | **-** | **-** | **-** |
| | මුළු එකතුව | **3427** | **3017** | **6444** |

**9.4 සේවා නියුක්තියේ ස්වභාවය (විදේශ රැකියාවල නියුක්ති අයද ඇතුළත්ව) - Nature of the Employability (Including Foreign Employees)**

| සේවා නියුක්ත ජනගහනය- Employed Population | | සේවා වියුක්ත ජනගහනය Unemployed Population | | එකුතව - Total |
|---|---|---|---|---|
| ස්ත්‍රී - Female | පුරුෂ - Male | ස්ත්‍රී - Female | පුරුෂ - Male | |
| 1147 | 1370 | 981 | 754 | 4252 |

**9.5 අංශ අනුව සේවා නියුක්තිය - Employment as per the Sectors**

| අනු අංකය - S.No | අංශය - Sector | ස්ත්‍රී - Female | පුරුෂ - Male | එකතුව - Total |
|---|---|---|---|---|
| 1 | රාජ්‍ය/පළාත් රාජ්‍ය - Govt./Local Government | 182 | 69 | 251 |
| 2 | අර්ධ රාජ්‍ය - Semi Government | 38 | 52 | 90 |
| 3 | පෞද්ගලික අංශය - Private Sector | 697 | 931 | 1628 |
| 4 | ස්වයං රැකියා - Self Employment | 225 | 106 | 331 |
| 5 | විදේශ සේවා නියුක්තිය - Foreign Employment | 81 | 136 | 217 |
| 6 | වෙනත්- Others | - | - | |
| | එකතුව- Total | 1223 | 1294 | 2517 |

**9.6 අස්වැසුම හා රජයේ සහනාධාරලාභී පවුල් වර්ගීකරණය - Aswesuma and Government Subsidy Receipient Families**

| අස්වැසුම ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - No. of Aswasuma Families | | | රජයේ වෙනත් සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව (වැඩිහිටි දීමනාව / රෝගාධාර / මහජනාධාර යනාදී) - No. of Families Receiving Government Subsidies (Elders Allowance/Medical Aids/Public Assistance, etc….) |
|---|---|---|---|
| අන්ත දිළිඳු - Severely Poor | දිළිඳු - Poor | සංක්‍රාන්තික සහ ආන්තික - Transitional and Vulnerable | |
| 7 | 26 | 76 | 165 |

**9.7 විශේෂ අවධානය යොමු කළ යුතු පවුල් සංඛ්‍යාව - Marginalized and Vulnerable Families**

| කාන්තා මූලික පවුල් සංඛ්‍යාව - No. of Women Headed Families | තනි මාපිය පවුල් සංඛ්‍යාව - No. of Single Parent Families | ආබාධිත පවුල් සංඛ්‍යාව - No. of Families with Disabled |
|---|---|---|
| 182 | 197 | 21 |

**9.8 මාසික ගෘහස්ථ ආදායම් රටාව - Monthly Domestic Income Pattern**

| මාසික ආදායම - Monthly Income | රු. 15000 හෝ ඊට අඩු - Rs.15000 or Below | රු. 15001-30000 | රු. 30001-45000 | රු. 45001-60000 | රු. 60001-75000 | රු. 75001-100000 | රු. 100000 ට වැඩි - Rs.100000 or Above |
|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව - No of Families | 53 | 421 | 449 | 289 | 181 | 142 | 129 |

**9.9 මාසික ගෘහස්ථ වියදම් රටාව - Monthly Domestic Expenditure Pattern**

| මාසික වියදම - Monthly Expenditure | රු. 15000 හෝ ඊට අඩු - Rs.15000 or Below | රු. 15001-30000 | රු. 30001-45000 | රු. 45001-60000 | රු. 60001-75000 | රු. 75001-100000 | රු 100000 ට වැඩි - Rs.100000 or Above |
|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව - No of Family | 31 | 382 | 489 | 290 | 199 | 151 | 122 |

## 10. වසමේ මූලික පහසුකම් හා පොදු පහසුකම් පිළිබඳ තොරතුරු - Basic Facilities and Common Facilities in GN Division

**10.1 නිවාස පහසුකම් අනුව පවුල් සංඛ්‍යාව - Categarization of Families with Housing Facilities**

| ස්ථිර නිවාස - Permenent Houses | අර්ධ ස්ථිර නිවාස - Semi Permenent Houses | තාවකාලික නිවාස - Temporay Houses | වතු තනි නිවාස - Estate Single Houses | වතු ලයින් කාමර - Estate Lines | කුලී හා බදු පදනම මත - Rent and Lease | නිවාස නොමැති - Homeless |
|---|---|---|---|---|---|---|
| **1479** | **16** | **-** | **-** | **-** | **169** | **-** |

### 10.2 සනීපාරක්ෂක පහසුකම් අනුව පවුල් සංඛ්‍යාව - Categarization of Families with Sanitary Facilities

| ජල මුද්‍රිත වැසිකිළි - Water Sealed | වල වැසිකිළි - Not Water Sealed | පොදු වැසිකිළි - Common Toilets | තාවකාලික වැසිකිළි - Temporay Toilets | වැසිකිළි නොමැති - Not using a Toilet |
|---|---|---|---|---|
| **1662** | **-** | **-** | **-** | **02** |

### 10.3 පානීය ජල පහසුකම් - Drinking Water facilities

| ප්‍රධාන මූලාශ්‍රය - Main Source | නිවාස සංඛ්‍යාව - No of Houses | පවුල් සංඛ්‍යාව - No of Families | රජයේ කාර්යාල - Government Office | ව්‍යාපාරික ස්ථාන - Commercial | කර්මාන්ත- Factory | පාසැල් - Schools | ආගමික ස්ථාන - Religious Places | වෙනත්- Others |
|---|---|---|---|---|---|---|---|---|
| තමාගේම ආරක්ෂිත ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Protected Well in Own House | 1315 | 1315 | | | | | | |
| තමාගේම අනාරක්ෂිත ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Unprotected Well in Own House | - | - | - | - | - | - | - | - |
| තමාගේම නළ ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Tube Well in Own House | - | - | - | - | - | - | - | - |
| ජල සම්පාදන මණ්ඩලය මගින් ජලය සපයා ගන්නා - Pipe Born Water | 1040 | 1040 | | | | | | |
| ප්‍රජා ජල ව්‍යාපෘති මගින් ජලය සපයා ගන්නා - Community Based Water Projects | - | - | - | - | - | - | - | - |
| ඇල, දොළ,ජල පිහිළි ස්වභාවික ජල උල්පත්, වැව් මගින් ජලය සපයා ගන්නා - Natural Water Streames | - | - | - | - | - | - | - | - |
| වැසි ජල ටැංකි මගින් ජලය සපයා ගන්නා - Rain Water | - | - | - | - | - | - | - | - |
| වෙනත් (සඳහන් කරන්න) - Others (Mention) | | | | | | | | |

| ප්‍රධාන මූලාශ්‍රය - Main Source | නිවාස සංඛ්‍යාව - No of Houses | පවුල් සංඛ්‍යාව - No of Families | රජයේ කාර්යාල - Government Office | ව්‍යාපාරික ස්ථාන - Commercial | කර්මාන්ත- Factory | පාසැල් - Schools | ආගමික ස්ථාන - Religious | වෙනත්- Others |
|---|---|---|---|---|---|---|---|---|
| විදුලිබල මණ්ඩලය/ ලංකා විදුලි පෞද්ගලික සමාගම මගින් විදුලිය ලබා ගන්නා (Ceylon Electricity Board & LECO) | 1525 | 1662 | 01 | 35 | 2 | 01 | 2 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සූර්ය කෝෂ මඟින් විදුලිය ලබා ගන්නා- Solar Pannel | 01 | 01 | | | | | | |
| ජීව වායු මඟින් විදුලිය ලබා ගන්නා - Bio Gass | | | | | | | | |
| කිසිදු ක්‍රමයකින් විදුලිය ලබා නොගන්නා (විදුලිය නොමැති) – No Electricity | 01 | 01 | | | | | | |

**10.4 විදුලි පහසුකම් - Electricity**

**10.5. විදුලි සංදේශ පහසුකම් - Telecomunication**

| අංශය - Sector | සම්බන්ධතා සංඛ්‍යාව - No of Connections | දුරකතන - Telephone | | ෆැක්ස් - Fax | ඊමේල් - E mail | අන්තර් ජාල - Internet |
|---|---|---|---|---|---|---|
| | | ස්ථාවර- Land | ජංගම- Mobile | | | |
| රාජ්‍ය - Government | 01 | 01 | - | 01 | 01 | 01 |
| අර්ධ රාජ්‍ය - Semi Government | - | - | - | | | |
| පෞද්ගලික (නිවාස)- Domestic | 451 | 451 | 5231 | 41 | 991 | 4212 |
| පෞද්ගලික (ව්‍යාපාරික ස්ථාන) – Private Sector | 19 | 19 | 24 | 13 | 19 | 21 |
| වෙනත්- Others | | | | | | |
| එකතුව- Total | 471 | 471 | 5255 | 55 | 1011 | 4234 |

**10.6 මාර්ග පිළිබඳ තොරතුරු - Roads**

| අනු අංකය No | මාර්ගයේ නම සහ දුර - Name & the Length of Road (km) | මාර්ග වර්ගය- Grade (A,B,C,D,E) | සංවර්ධනය කර ඇති දුර කි.මි. - Length Developed Km |
|---|---|---|---|
| 01 | 120 හොරණ කොළඹ පාර<br>162/2 මොරුද පාර,<br>පාසල් මාවත | B<br>D | 0.25Km<br>0.25Km<br>1.5Km |
| 02 | ශ්‍රමදාන මාවත<br>හර්මන් මයිනර් මාවත | | 0.5Km<br>0.25Km |
| 03 | ගලබඩ වත්ත පාර<br>දවටගහ වත්ත පාර<br>සෝමවීර චන්ද්‍රසිරි මාවත<br>දවටගහවත්ත අතුරු මාර්ග<br>ගොඩපර ගහවත්ත පාර<br>දූව වත්ත අතුරුමාර්ග | | 0.5Km<br>0.25Km<br>0.25Km<br>(0.5Km)<br>(0.5Km)<br>(0.25Km) |

## 10.7 අධ්‍යාපන පහසුකම් - Educational Facilities

| රජයේ පාසල් සංඛ්‍යාව - No. of Govemnet Schools | | | | රජයේ අනුමත පෞද්ගලික පාසැල් සංඛ්‍යාව (1-13/ 6-13) - No. of Grovernment Approved Private Schools | පෞද්ගලික පාසල් සංඛ්‍යාව - No.of Private Schools | | | පිරිවෙන් සංඛ්‍යාව - No of Piriven | විශේෂිත පාසැල් සංඛ්‍යාව - No. of Special Schools | උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව - No.of Higher Educational Institute | වෘත්තීය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව - No. of Vocational Education Institute | පෙර පාසැල් සංඛ්‍යාව - No. of Pre Schools | දහම් පාසැල් - No. of Daham Schools |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1-5 | 1-11/ 1-8 / 6-11 | 1-13 / 6-13 | | | 1-5 | 1 -11 / 6-11 | 1-13 | | | | | | |
| | | **ජාතික - National** | **පළාත - Provincial** | | | | | | | | | | |
| | - | - | - | - | | - | - | - | - | - | - | **6** | **2** |

## 10.8 සෞඛ්‍ය සේවා පහසුකම් - Healh Facilities

| වර්ගය - Category | සංඛ්‍යාව - **Numbers** |
|---|---|
| ශික්ෂණ රෝහල් - Teaching Hospital | **-** |
| මූලික රෝහල්- Base Hospital | **-** |
| දිස්ත්‍රික් රෝහල් - District Hospital | **-** |
| ග්‍රාමීය රෝහල් - Rural Hospital | **-** |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය- MOH | **-** |
| රජයේ සායන මධ්‍යස්ථාන - Govt.Clinic Centers | **01** |
| ආයුර්වේද බෙහෙත්ශාලා - Aurvadic Centers | **-** |
| මධ්‍යම බෙහෙත් ශාලා - Central Dispenceries | **-** |
| පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන -Private Medical Centers | **3** |
| වෙනත් (සඳහන් කරන්න)- Others (Specify) | **-** |

## 10.9 වෙළෙඳපොළ පහසුකම් - Market Facilities

| **වර්ගය - Category** | **සංඛ්‍යාව - Number** |
|---|---|
| සතිපොළ - Fair | **කාන්තා ගොවි සමිති පොළ 1** |
| සතොස - Sathosa | **-** |
| සමුපකාර - Cooparatives | **-** |
| සුපිරි වෙළඳසැල් - Super Market | **-** |
| පොදු වෙළඳ සංකීර්ණ - Central Market | **-** |
| ආර්ථික මධ්‍යස්ථාන - Economic Centers | **-** |
| වෙනත් (සඳහන් කරන්න) - Others (Mention) | **17** |

**10.10 පොදු ප්‍රවාහන පහසුකම් සපයා ගන්නා ආකාරය - Mode of Public Transport Facilities**
**( √ ලකුණ යොදන්න / Mark √ )**

| ප්‍රවාහන මාධ්‍යය - Mode of Tranportation | බස් රථ - Buses | දුම්රිය - Trains | වෙනත් පොදු ප්‍රවාහන සේවා - Other Public Transport Facilities |
|---|---|---|---|
| ප්‍රමාණවත්ව ඇත - Sufficiently Available | | - | - |
| ප්‍රමාණවත්ව නැත - Not Sufficiently Available | | | |
| නැත - Not Available | | | |


**11. දැනට භාවිතා නොකරන නමුත් භාවිතයට ගතහැකි රජයේ සහ පෞද්ගලික ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර හා වෙනත් සම්පත් ( පවතීනම්) – Unused but usable Government & Private Resources such as Buildings, Machinaries and Others (Available)**

| අයිතමය -Item | අයිතිය - Ownership | | පෙර භාවිතයේ ස්වභාවය - Previous Usage |
|---|---|---|---|
| | රජයේ - Government | පෞද්ගලික- Private | |
| පේෂ කර්මාන්ත ගොඩනැගිල්ල | | | දේශීය අත්යන්ත රෙදිපිළි නිෂ්පාදනය |
| | | | |

**12. වසමේ පවතින ප්‍රජා සංවිධාන හා ආයතන - CBOs in GN Division**

| | ප්‍රජා සංවිධානය/ආයතනයේ නම - Name of the CBO/ Institute | සේවාව - Services |
|---|---|---|
| 01. | සුසිරි වැඩිහිටි සමිතිය | වැඩිහිටියන් ස හා සුභ සාධන කටයුතු |
| 02. | සුභසාධන හා අවමංගල්‍යාධාර සමිතිය | අවමංගල්‍ය හා සුභ සාධන කටයුතු |
| 03. | ප්‍රජා මණ්ඩලය | ප්‍රජා සුභසාධන කටයුතු |
| 04. | ග්‍රාම සංවර්ධන සමිතිය | ප්‍රජා සුභ සාධක කටයුතු |
| 05. | හල්පිට ප්‍රජා සංවර්ධන හා සුභසාධක සමිතිය | ප්‍රජා සුභසාධක කටයුතු |
| 06. | ජනශක්තිපුර සුභසාධක සමිතිය | ප්‍රජා සුභසාධක කටයුතු |
| 07. | හල්පිට කාන්තා ශක්ති කාන්තා සමිතිය | |
| 08. | සණස සමිතිය ණය ගණුදෙනු | |

**13.සමාජ සිතියම- Social Map**



**14 . ප්‍රමුඛතාගත කළ සංවර්ධන යෝජනා - Prioritised Development Proposals**

**එක් එක් ක්ෂේත්‍ර අනුව හඳුනාගනු ලබන සංවර්ධන යෝජනා සමස්තයක් වශයෙන් ප්‍රමුඛතාවය අනුව පෙළගස්වා ප්‍රමුඛතා අංකය යෙදිය යුතුය. - All the Development proposals identified for each sector should be prioritized and ranked as a whole.**

**14.1 යටිතල පහසුකම් සංවර්ධනය යෝජනා (විදුලිය, පානිය ජලය, නිවාස, සනීපාරක්ෂක පහසුකම්, ප්‍රවේශ මාර්ග, වාරිමාර්ග යනාදී) - Infrastructure Development Proposals ( Electricity, Drinking Water, Housing, Sanitory Facilities, Roads, Irrigation etc.)**

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | හල්පිට පාසල් මාවත අමුණ අසළ පාලම අලුතින් ඉදිකිරීම | 1 | | හල්පිට නිවුන්ගම සියලු ප්‍රජාව |
| 02 | 570 යහල්පිට වසමේ මර්ග පද්දතිය සංවර්දනය කිරීම | 2 | | |
| 01 | අඹ හේනවත්ත පළමු පටුමග ගෘහ අංක 98/51 සිට ගෘහ අංක 100/1 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 15 | පවුල් 15 |
| 02 | 03 . අඹහේන වත්ත දෙවන පටුමග ගෘහ අංක 98/1/A සිට ගෘහ අංක 98/3/ D දක්වා කොටස සංවර්ධනය කිරම | | ලක්ෂ 15 | පවුල් 06 |
| 03. | හල්පිට හරිත උයන මාර්ගය සම්පූර්ණයෙන් සංවර්ධනය කිරිම | | ලක්ෂ 30 | පවුල් 12 |
| 04. | අඹ හේන වත්ත පළමු පටුමගේ ආරම්භයේ සිට අවසානය දක්වා වැසි ජලය බැස යාමට කාණු පද්ධතියක් ඉදිකිරීම | | ලක්ෂ 20 | පවුල් 15 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ගල්බඩ වත්ත පළමු පටුමග සෞමය අයන පාර අසළ සිට මොරැද පාර හමුවන ස්ථානය දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීම | | ලක්ෂ 25 | පවුල් 70 |
| 06 | විමලරාම පාර පන්සල අසළ සිට ගෘහ අංක 157/*D* / 17/09 මිතුම් චතුරංග වඩුමඩුව දක්වා කොටස සංවර්ධනය කිරිම | | ලක්ෂ 20 | පවුල් 25 |
| 07 | හර්මන් මයිනාර් මාවත තුන්වන පටුමග ගෘහ අංක 78/6 නිවස අසළ සිට 78/3 නිවස දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 15 | පවුල් 07 |
| 08 | පාසල් මාවත 6 වෙනි පටුමග සම්පූර්ණයෙන් සංවර්ධනය කිරිම (ස්වීටී ගේ අසළ පාර) | | ලක්ෂ 20 | පවුල් 18 |
| 09 | හර්මන් මයිනර් මාවත 4 වන පටුමග ගෘහ අංක 81/1 සිට 81/2 දක්වා කොටස | | ලක්ෂ 15 | පවුල් 08 |
| 10 | හරුමන් මයිනර් මාවත 4 වන පටුමග ගෘහ අංක 94 සිට 94/4 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 10 | පවුල් 08 |
| 11 | හර්මන් මයිනර් මාවත 7 වන පටුමග ගෘහ අංක 97/1 සිට 96/5 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 10 | පවුල් 08 |
| 12 | දෙල්ගහ වත්ත පාර සම්පුර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම | | ලක්ෂ 25 | පවුල් 40 |
| 13 | හර්මන් මයිනර් මාවත 8 වන පටුමග ගෘහ අංක 104/9/2 සිට 102/ / 1 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 15 | පවුල් 08 |
| 14 | හර්මන් මයිනර් විද්‍යාලය ඉදිරිපිට සිංහල බෙහෙත් | | ලක්ෂ 15 | පවුල් 20 |

| | | | | |
|---|---|---|---|---|
| | වෙදමැදුර අසළ මාර්ගය සම්පූර්ණයෙන් සංවර්ධනය කිරීම | | | |
| 15 | හර්මන් මයිනර් මාවත අවසාන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ( ගම් මායිම් හැර) | | ලක්ෂ 20 | පවුල් 12 |
| 16 | ගලබඩ වත්ත දෙවන පටුමග අවසාන කොටස ගෘහ අංක 103/ A සිට ගෘහ අංක 103 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 10 | පවුල් 10 |
| 17 | පාසල් මාවත නිවුන්ගම පන්සල පාර බුදු පිළිමය අසල සිට රණවිරු මාවත දක්වා කොටසේ කාණු පද්ධතිය ඉදි කිරීම | | ලක්ෂ 20 | පවුල් 60 |
| 18 | දූව වත්ත පාර කාණු පද්ධතිය ඉදි කිරීම | | ලක්ෂ 15 | පවුල් 20 |
| 19 | හල්පිට බතල වත්ත පාරට සම්බන්ධිත අතුරුමාර්ගයේ ගෘහ අංක 174/4/1 සිට 177/3/1/B දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 07 | පවුල් 08 |
| 20 | හර්මන් මයිනර් මාවත වන්ගු දෙක ලග පැති කන්නාඩි සවි කිරීම | | ලක්ෂ 02 | සමස්ත ප්‍රජාව |
| 21 | හර්මන් මයිනර් මාවත Keemuthu පෙර පාසල අසල පලමු පටුමගේ ගෘහ අංක 77/33/8 සිට 77/33/14 දක්වා කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 10 | පවුල් 20 |
| 22 | කම්මල ලග පාරේ වැසි ජලය බැස යාමට කාණුවක් දැමීම | | ලක්ෂ 05 | පවුල් 20 |
| 23 | හල්පිට හතරවැනි පටුමගට සම්බන්ධිත අතුරු මාර්ගයේ | | ලක්ෂ 15 | පවුල් 10 |

| | | | | |
|---|---|---|---|---|
| | ගෘහ අංක 104/$C$ සිට 104/$D$ දක්වා කොටස සංවර්ධනය කිරීම | | | |
| 24 | කනත්ත ඉදිරිපිට මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම | | ලක්ෂ 20 | පවුල් 20 |
| 25 | හල්පිට ගොඩසර ගහ වත්ත මැදහරේ වැඩි ජලය ගලා බසින කාණු පද්ධතියක් ඉදිකිරිම | | ලක්ෂ 15 | පවුල් 20 |
| 26 | දූව පෙදෙස වටා ඇළ මාර්ගයක් සැකසීම තුළින් ගංවතුරට යටවීම පාලනය කිරීම | | ලක්ෂ 10 | පවුල් 08 |

## 14.2 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - Micro, Small and Medium Scaled Entreprenuership Development Proposals

### 14.2.1 නව ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - New Entreprenuership Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | 01 . හල්පිට පුරන් කුඹුරු යායෙන් අක්කර දෙකක් අත්පත් කරගෙන සමෝධානික ආදර්ශ ගොවිබිමක් ඇති කිරීම | 03 | ලක්ෂ 40 | 30 |
| 02 | බිම්මල් වගාව ප්‍රවර්ධනය සඳහා නව ව්‍යවසායකයන් තිදෙනෙකු සඳහා බිම්මල් ලබාදීම | *21* | 750000 | 3 |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභින් 6 දෙනෙකු සඳහා නව තාක්ෂණික පුහුණුව ලබා දීම | | | |
| 03 | රැකියා අපේක්ෂිත කාන්තාවන් 25 දෙනෙකු සඳහා අතිරික්ත ආහාර භෝග විජලනය සම්බන්ධ අවශ්‍ය තාක්ෂණය හා දැනුම පුහුණුව ලබා දීම තුළින් නව ව්‍යවසායකයන් 25 ක් ගොඩනැගීම | 22 | රු 50000 | 25 |
| 04 | අගය එකතු කළ කාබනික නිෂ්පාදනයන් බිහිකිරීම හා ඒ සඳහා පුහුනු වෙළඳපළ හන්වාදීම හා අනෙකුත් පහසුකම් සැළසීම යටතේ අගය එකතු කළ නිෂ්පාදන ක්‍රම හදුන්වා දීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම. ප්‍රතිලාභින් 10 දෙනෙකු සඳහා ආයතන අතර සම්බන්ධීකරණය ගොඩනගා දිම හරහා නව ව්‍යවසායකයින් බිහිකිරීම. | 10 | 500000 | 25 |

**14.2.2 දැනට පවතින ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - Existing Entreprenuership Development Proposals**

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | 570 හල්පිට කාන්තා ගොවි සමිතිය මගින් පවත්වාගෙනයනු ලබන දිරිය පොළ සහ ස්ථිර තහඩු මඩුවක් ලබා දීම හරහා වෙළඳපොළ කටයුතු විධිමත් කිරීම මගින් කාන්තාවන් 25 දෙනෙකුගේ ආදායම් මට්ටම ඉහල තැබීම | 08 | 150000 | 25 |
| 02 | *Good market* ඉලක්ක කර කාබනික බිත්තර නිෂ්පාදනය පවර්ධනය කිරීම සහ ප්‍රතිලාභීන් 25 දෙනෙකු ස හා කුකුල් පැටව් ලබා | *23* | ලක්ෂ 400000 | 25 |

| | | | | |
|---|---|---|---|---|
| | දීම හා ප්‍රතිලාභීන් දෙදෙනෙකු සහ කුකුල් මඩු ලබාදීම | | | |
| 03 | *Good market* ඉලක්ක කර මිහිලිය නමින් දැනට කෘෂි නිෂ්පාදන ඉදිරිපත් කරන අතර එය ප්‍රවර්ධනය සඳහා ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා අවශ්‍ය අපකරණ බෙහෙත් හා අනෙකුත් යෙදවුම් ලබාදීම.අගය එකතු කළ නිෂ්පාදන සැකසීම සහ අවශ්‍ය පුහුණුව හා පහසුකම් සැළසීම | *09* | 500000 | 25 |
| 04 | දැනට පවතින ව්‍යවසායකයන් සහ නව කර්මාන්ත වඩාත් පුලුල් මට්ටමකට ගෙන ඒම සහ අඩු පොලී අනුපාත ණය යෝජනා ක්‍රමයක් වෙත යොමු කිරීම සඳහා බැංකු සම්බන්ධිකරණය කර මූල්‍ය ණය සපයන වැඩසටහන් පැවැත්වීම | 24<br>13 | | 05 |
| 05 | විවිධ ස්වයං රැකියා 15 දෙනෙකු සඳහා ප්‍රජා දායක්වය 50% යටතේ ජීවනෝපාය ප්‍රවර්ධනය සහ උපකරණ ලබා දීමේ වැඩසටහනක් සිදුකිරීම | 12 | 2000000 | 15 |

## 14.3 විකල්ප ආදායම් ව්‍යාපෘති යෝජනා - Alternative Income Generating Project Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්තකරුවන් 10 දෙනෙකු සඳහා ව්‍යාපාර වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැංකු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනගා දීම. | 11 | - | 05 |

| | | | | |
|---|---|---|---|---|
| | ( බැංකු හා මූල්‍ය ආයතන සම්බන්ධ කර මූල්‍ය සායනයක් පැවැත්වීම) | | | |
| 02 | රැකියා විරහිත 25 දෙනෙකු සඳහා විවිධ ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම සහ තාක්ෂණික දැනුම පුහුණුව. වෙළඳපල අවස්ථා හා පහසුකම් ලබාදීම හරහා රැකියා විරහිත බව අවම කිරීම | 14 | 2000000 | 20 |
| 03 | | | | |

### 14.4 නිපුණතා හා ධාරිතා සංවර්ධන යෝජනා - Skill and Capasity Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | 570 හල්පිට *YOUTH CLUB* හරහා රැකියා විරහිත හා පාසල් හැරගිය ප්‍රජාව සඳහා ක්‍රමවත් *වෘත්තීය* අධ්‍යාපනයට යොමු කිරීමේ අරමුණින් *වෘත්තිය* පුහුණු වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම. | 05 | 500000 | 40 |
| 02 | වෘත්තීය පුහුණුව ලබා ගැනිම සහා ප්‍රදේශයේ පවතින වැඩබිම් සහ එම ආයතන සම්බන්ධ කර තරුණ ප්‍රජාව යොමු කිරිම | 17 | 25000 | 40 |
| 03 | විදේශ රැකියා ඉලක්ක කර භාෂා පුහුණු වැඩසටහනක් පැවැත්වීම හරහා තරුණ ප්‍රජාව 25 දෙනෙකු බලගැන්වීම | 15 | 300000 | 25 |

## 14.5 සමාජ සංවර්ධන යෝජනා - Social Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | සියලු ප්‍රජාව ඉලක්ක කර සෑම වසරකටම වරක් බෝ නොවන රෝග පිළිබඳව ජංගම සායන වැඩසටහනක් පැවැත්වීම හරහා රෝග නිවාරණය ඇතිකිරීම. | 04 | 125000 | 200 |
| 02 | තරුණ ප්‍රජාව සහ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පැවැත්වීම හරහා මත්ද්‍රව්‍ය වෙත යොමුවීම පහළ අගයකට ගෙන ඒම | 16 | 125000 | 100 |
| 03 | වසමේ සියලු ප්‍රජාව සම්කන්ධ කර ගනිමින් පාරම්පරික සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම<br>ඒ යටතේ ගම් මඩු දෙවොල් මඩු ආදී ශාන්තිකර්ම වැඩසටහනක් පැවැත්වීම | 20 | 500000 | සමස්ථ ප්‍රජාව |
| 04 | විමලාරාම විහාරස්ථානයේ දහම්පාසල් ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම | | 5000000 | සමස්ථ ප්‍රජාව |

## 14.6 පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා - Environmental Protection Project Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | මහ ඇළ ඉවුර සංරක්ෂණය සහ රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම | *18* | 50000 | සමස්ථ ප්‍රජාව |
| 02 | රජයේ ඉඩම් හා ක්‍රීඩා භූමි වටා පළතුරු පැළ සිටුවීම | *19* | 50000 | සමස්ථ ප්‍රජාව |
| 03 | ඌණ පරිහරණ ඉඩම් ප්‍රශස්ථ පරිහරණයක් දක්වා වැඩි දියුණු කිරිම සහ ප්‍රායෝගික වැඩසටහනක් පැවැත්වීම යටතේ ඉඩම් හිමියන් 25 | *25* | 100000 | 10 |

| | | | | |
|---|---|---|---|---|
| | දෙනෙකු සදහා ප්‍රශස්ථ ඉඩම් පරිහරණය පිළිබද දැනුවත් කිරිම් හා කාලින බෝග වගාව සදහා යොමුකරවා ගැනිම | | | |
| 04 | කසළ කළමණාකරණය පිළිබදව ප්‍රායෝගික වැඩසටහනක් පැවැත්විම ඒ යටතේ කසළ වෙන්කිරීම පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විම හා ප්ලාස්ටික් කසළ රැස් කිරීමේ බදුන් ස්ථාපනය කිරිම හා ප්ලාස්ටික් අලවිය සිදුකිරිම මගින් කසළ කළමණාකරණය සිදු කිරිම | 26 | 100000 | සමස්ථ ප්‍රජාව |
| 05 | හල්පිට මහයාය වෙල්යාය සම්බන්ධ කරගෙන තෙත් බිම් සංරක්ෂණ වැඩසටහන් සිදු කිරිම ( ඇළ ඉවුරු සංරක්ෂණය සදහා රුක් රෝපණය කිරිම ඇළමාර්ග සදහා අප ද්‍රව්‍ය බැහැර කිරිම වැළැක්විමට ක්‍රමෝපායක් යෙදවිම) පුරන් කුඹුරු වී වගාව සදහා යොදවා ගැනීම. | 27 | 100000 | සමස්ථ ප්‍රජාව |

**14.7 වෙනත් සංවර්ධන යෝජනා (අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, ධීවර, වැවිලි, කර්මාන්ත, සේවා යනාදී) - Other Development Proposals (Education, Health, Agriculture, Fisheries, Plantation, Industry, Services etc.)**

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | 01 . 570 හල්පිට ක්ෂේත්‍ර නිළදාරී කාර්යාලීය පරිශයේ ඇති ගොඩනැගිල්ල නවීකරණය කර සේවා පිරිසක් සහ කෘෂි උපකරණ හා කෘෂි නිෂ්පාදන ගබඩාවක් දක්වා පරිවර්තනය කිරීම හා පෙර පාසල නැවත එම ස්ථානයේ ස්ථාපනය කිරීම | 06 | 2500000 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | 02 . දවටගහවත්ත ප්‍රජාශාලාව නවීකරනය කර සියලු ස්වේච්චා සංවිධාන කටයුතු එහි පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම හා ඉන් කොටසක් ප්‍රජාවගේ අවශ්‍යතා සහ සහනදායි මුදලකට කුළියට දීම | 07 | මිලියන 10 | සමස්ථ ප්‍රජාව |
| 03 | 03 . හල්පිට ගොවි සංවිධානය සහ වී වියළිමේ යන්ත්‍රයක් ලබාදීම | 29 | මි.2 | ගොවීන් 60 |
| 04 | හල්පිට පාසල් මාවත ක්‍රීඩාංගනයේ අත්පන්දු ක්‍රීඩාපිටිය හා ඉදිරිපස ඇති ක්‍රීඩා භූමිය සංවර්ධනය කිරිම | 28<br>37 | මි.15 | සමස්ථ ප්‍රජාව |
| 05 | හල්පිට දෙව්වන්දුව යාය මැද ඇළ අමුණ ඉදිකිරීම | 38 | මි.1 | ගොවීන් 10 |
| 06 | පල්ලෙපත්තු කුරු ඉඩමට යන පාර හරහා ජලය බැසීම සහ බෝක්කු කිහිපයක් ඉදි කිරිම | 39 | මි.1 | ගොවින් 12 |
| 07 | ගල්වල කනත්ත කෘෂි පාර වැවේ දෙණිය කුඹුරෙන් ටැක්ටර් රථ බැස්සුමක් ඉදිකිරීම | 40 | 800000 | ගොවීන් 20 |
| 08 | සෞම්‍ය උයන ප්‍රජාශාලාව අසළ දහම් මාවත කෙළවර කුඹුරුයායට සම්බන්ධ වන බෝක්කුව විශාල කිරීම | 32 | 1000000 | ගොවීන් 20 |
| 09 | හල්පිට හර්මන් මයිනර් මාවතේ ගමගේ කුඹුර අසළ ටැක්ටර් රථ පැන්නුමක් ඉදිකිරීම | 33 | 1000000 | 10 |
| 10 | හර්මන් මයිනර් මාවතේ දෙවැනියාය වැවේ කුඹුර අසළ ට්‍රැක්ටර රථ පැන්නුමක් ඉදි කිරීම | 34 | 10000000 | 10 |
| 11 | දූව පුදේශයේ වෙල්යායට පිට ඇළක් මැද ඇළ දක්වා (300 m දිග හා 1m පළල )ඉදිකිරිම | 36 | 500000 | 12 |
| 12 | සුසාන භූමියේ මායිම් ලකුණු කර වැවක් ඉදිකිරීම | 35 | 4000000 | සමස්ථ ප්‍රජාව |
| 13 | පාසල් මාවතේ ධාවනය වන මගී ප්‍රවාහන බස් රථයක් යොදාගැනීම | 31 | - | සමස්ථ ප්‍රජාව |
| 14 | හල්පිට වෙල්යායේ වෙල් අක්කර ඉවත්කර වී වගාවට සුදුසු කුඹුරු යායක් දක්වා පරිවර්තනය කිරීම | 30 | 5000000 | ගොවින් 30 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | පාසල් මාවත හා හර්මන් මයිනර් මාවත සම්බන්ධ කරමින් ප්‍රධාන පාලම අසළින් කෘෂි මාර්ගයක් ඉදිකිරිම | 31 | 1500000 | සමස්ථ පජාව |